## චතුරිකා සමයේ තුන්වන ඉරිදා (A) – 08.03.2026

*නික්මයාම 17:3-7; රෝම 5:1-2, 5-8; යොහන් 4:5-42*

අපගේ ස්වාමීන් වහන්සේ වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ තම ජීවිතය අප සමඟ බෙදා ගනී. ඔහුගේ අසීමිත ප්‍රේමය ඔබ සමඟ වේවා!

### හැඳින්වීම

අපි අද මේ පූජාවට පැමිණෙන්නේ අපි යථාර්ථයෙන්ම කවුදැයි එසේම — සමහරවිට අපගේ සෞඛ්‍යය සහ ජීවිතය ගැන ස්තුතිවන්තව, නමුත් සමහරවිට දෙවියන් වහන්සේ ඉදිරියේ අපට කැමති පරිදි නොවී සිටින බවේ බර දැනෙමින්. අපගේ සැමියා හෝ බිරිඳ, දරුවන්, රැකියාව හෝ සම්බන්ධතා තුළ අප අඩුවෙන් සිටින බව අපට හැඟෙන්නට පුළුවන. ජීවිතය අප බලාපොරොත්තු වූ ආකාරයට නොගිය බවත් අපට සිතෙන්නට පුළුවන.

කුඩා ගම්මානයක එකම ළිඳ වියළී ගිය කතාවක් මට කියවීමට ලැබුණා. මිනිසුන් සෑම තැනම සෙවූ නමුත්, අවසානයේ එක් කුඩා දරුවෙක් අමතකවූ කොනක සිටින කුඩා ජල ධාරාවක් දුටුවා. ඉවසීමෙන්, සැලකිල්ලෙන් සහ සුළු කැණීම්වලින් ගම්වාසීහු නැවත ජලය ගලා එන්න සකස් කළා. ජීවිතය ෆ්ස්සේ නමුත් ස්ථිරවම නැවත පැමිණිණි. දෙවියන් වහන්සේ අපව හමුවන්නේද එසේමය.

අපි අසල නොපෙනෙන, බිඳුණු හෝ හිස්වූ ලෙස හැඟුනත්, ඔහු අපගේ පිපාසය දකිනවා. ඔහු අපට ඔහුගේ ප්‍රේමයෙන් සහ කරුණාවෙන් ගැඹුරින් පානය කිරීමට ආරාධනා කරනවා.

ජේසුස් ක්‍රිස්තුස් තුළ අපට ප්‍රකාශ වූ ඔහුගේ ප්‍රේමයට අපේ හදවත් විවෘත කරමු. ඔහු අප සමඟ ජීවිතය බෙදා ගනිමින් අපේ ආත්මයන් නවීකරණය කරන "ජීව ජලය" අපට දෙන සේක. ඔහුගේ අසීමිත ප්‍රේමය ඔබ සමඟ වේවා!

### දේශනාව: "කවදාවත් වියළී නොයන ජලය"

අද කාලයේ බීම දිය සාප්පුවකට ගොස් බලන විට, විවිධ ජල වර්ග රැසක් දකින්නට ලැබේ — ගල් ජලය, සාමාන්‍ය ජලය, අඩු ලවණ සහිත ජලය, උල්පත් ජලය ආදී ලෙස. "සියලු ජල එකසේ නොවේ." අද සුසුම් පණිවිඩය සම්බන්ධයෙන් සිතන විට, මේ සරල වචනයට ගැඹුරු අර්ථයක් ලැබේ.

ජොහන්තු තුමාගේ දේ්ව වචනය තුළ, සමාරියා කාන්තාවක් සහ යේසුස් වහන්සේ අතර සිදුවන හමුවක් විස්තර කරයි. ඔවුන් දෙදෙනාම "ජලය" ගැන කතා කරති, නමුත් එකිනෙකා නොතේරෙමින්. "සියලු ජල එකසේ නොවේ" යැයි යේසුස් වහන්සේ කියන සේය. සියලු පිපාස එකසේ නොවේ; සියලු සැනසුම් දිරවා නොයයි.

වියළි කාන්තාරයක පාවහන් නොමැතිව දිවෙන කුඩා දරුවෙකු සිතන්න. හිරු රශ්මිය උණුසුම්. හදිසියේ දුරින් ළිඳක් දකින්නට ලැබේ. ඔහු ජලය පානය කරයි. මොහොතකට පිපාසය සන්සුන් වේ. නමුත් ටික වේලාවකින් නැවත පිපාසය පැමිණේ. ජීවිතයද එසේමය. සාර්ථකත්වය, සම්බන්ධතා, දේපල — මේවා තාවකාලික සැනසුම් දෙනවා. නමුත් අපේ හදවතේ ගැඹුරු පිපාසය තවමත් ඉතිරිව පවතී.

අද සුසුම් පණිවිඩය අපට කියන්නේ ශාරීරික පිපාසයක් ගැන නොව, ජීවිතය, අර්ථය, ආදරය සහ දෙවියන් වහන්සේ සඳහා ඇති පිපාසයක් ගැනයි. සමාරියා කාන්තාව සම්මත ලෙස ජලය ගන්නට පැමිණියා. නමුත් යේසුස් වහන්සේ ඇයව අසන්නේ, “මට බොන්න දියක් දෙන්න.” ඒ සරල ඉල්ලීම අසාමාන්‍ය හමුවකට දොර විවර කරයි.

## ජලය සරල ජලයක් පමණක් නොවේ

“මම දෙන ජලය පානය කරන කෙනා කිසිදා පිපාස නොවනු ඇත” යයි යේසුස් වහන්සේ කියයි. සාමාන්‍ය ජලය කාලයක් සඳහා සැනසුම් දෙන නමුත්, ඔහු දෙන ජීව ජලය අපගේ ගැඹුරු ආශාවන් සම්පූර්ණ කරයි. ශුද්ධ ලේඛන තුළ ජලය ජීවිතය, නවීකරණය, දෙවියන් වහන්සේගේ ප්‍රේමය නිරූපණය කරයි.

## අනපේක්ෂිත පණිවිඩකාරිය

මේ කතාවේ අසාමාන්‍ය දෙය ජලය පමණක් නොව, කාන්තාවමය. සමාජයෙන් අගය නොලැබූ ඇයව යේසුස් වහන්සේ තෝරාගනී. ඇය තම ජල කූඩුව තැබා නගරයට දිව යමින් “එන්න, බලන්න!” යයි කියයි. ඇය අනෙක් අයට ජීව ජලයේ මූලාශ්‍රයක් වේ.

## සැබෑ ජීවිතය සඳහා පිපාසය

Saint Teresa of Avila “Solo Dios basta” — “දෙවියන් වහන්සේ පමණක් ප්‍රමාණවත්” යයි කියයි.

ශාන්ත අගොස්තිනු මුනිතුමා ද “අපගේ හදවත දෙවියන් තුළ විවේකය ලබන තුරු නොසන්සුන්ය” යයි පවසයි.

ජේසුස් වහන්සේ අපගේ දෛනික ජීවිතයේ “ළිඳ” අසළ අපව හමුවෙයි. චතුරිකා කාලයේ උපවාසය, යාච්ඤාව සහ ආත්ම පරීක්ෂාව අපට මේ ජීව ජලය පිළිගැනීමට උපකාරී වේ.

## මතුපිටට පහළින් බලන්න

අප බොහෝ විට “ඔබ කොහොමද?” යැයි අසන නමුත්, සැබෑ පිළිතුරක් දක්නට නොලැබේ. නමුත් යේසුස් වහන්සේ අපගේ අභ්‍යන්තරය දකින සේක. අපේ අඩුපාඩු, අපේ ආශාවන්, අපේ දුර්වලතා ඔහු දන්නා සේක. ආත්මික ජීවිතය ආරම්භ වන්නේ

අපගේ පිපාසය පිළිගෙන දෙවියන් වහන්සේට එය පිරවීමට ඉඩ දීමෙන්ය.

## මූලාශ්‍රයක් වීම

ජේසුස් වහන්සේ ඇයගේ පිපාසය පමණක් නිවා නොදමයි; ඇයව අනෙක් අය සඳහා ජීව ජලයේ මූලාශ්‍රයක් කරයි. අපගේ දෙවියන් සමඟ ඇති හමුව අප වෙනුවෙන් පමණක් නොව, අනෙක් අය සඳහාද වේ.

## අවසානය

හිතවත් සහෝදර සහෝදරියනි, මේ චතුරිකා සමයේ අපි ජීව ජලය සොයමු. මතුපිටින් නොව, ගැඹුරට යමු. දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ ළිඳෙන් පානය කරමු. අපගේ "ජල කුඩු" තබා, අනෙක් අයත් එම ජලය පානය කිරීමට ආරාධනා කරමු.

ආමෙන්.

- **Translated by Lasanthi Peter**